The Dinamina e paper

100%

# 'විදුදය රිට්ස්බරි' අන්තර් පාසල් පිහිනුම් ශූරතාවලිය 27-28 දිනවල ජ'පුර පිහිනුම් තටාකයේ දී




සී.බී.එල්. ආයතනයේ අලෙවි කළමනාකාර තිලුපුල් ද සිල්වා විසින් 'විදුදය රිට්ස්බරි' අන්තර් පාසල් පිහිනුම් ශූරතාවලියේ අනුග්‍රාහකත්වය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ උපකුලපති මහාචාර්ය සම්පත් අමරතුංග මහතාට ලබා දුන් අවස්ථාව.

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය හා එක්ව සිලෝන් බිස්කට් ලිමිටඩ් ආයතනයේ රිට්ස්බරි චොකලට් සංවිධානය කරන 'විදුදය රිට්ස්බරි' අන්තර් පාසල් පිහිනුම් ශූරතාවලිය මෙම 27 හා 28 වැනි දිනවලදී පැවැත්වේ.

ශ්‍රී ජයර්ධනපුර විශ්ව විද්‍යාලීය පිහිනුම් තටාක සංකීර්ණයේදී පැවැත්වීමට නියමිත මේ ශූරතාවලිය සඳහා දිවයිනේ පාසල් 130කට වැඩි සංඛ්‍යාවකින් ක්‍රීඩක ක්‍රීඩිකාවන් 2500කට වැඩි සංඛ්‍යාවක් සහභාගි වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

මේ තරගාවලිය යටතේ කේවල තරග 96ක් සහ කනිෂ්ඨ, ජ්‍යෙෂ්ඨ, සමස් ශූරතා කුසලාන සඳහා වයස අවුරුදු 9, 11, 13, 15, 17 හා 19න් පහළ තරගකරුවන් සහභාගි වන සහාය පිහිනුම් තරග 24ක් පැවැත්වීමට නියමිතය.

සර් ජෝන් ටාබට් පාසල් මලල ක්‍රීඩා ශූරතාවලිය, කනිෂ්ඨ හා ජාතික ස්කොෂ් ශූරතාව, අන්තර් ජාත්‍යන්තර පාසල් මලල ක්‍රීඩා තරගාවලිය හා වෙළඳ සේවා මලල ක්‍රීඩා තරගාවලියට අනුග්‍රහය දක්වමින් සිටින සිලෝන් බිස්කට් ලිමිටඩ් (සී.බී.එල්.) ආයතනය පිහිනුම් ක්‍රීඩාව සඳහා අනුග්‍රාහකත්වය ලබා දෙන ප්‍රථම අවස්ථාව මෙය වෙයි.